**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බවට අනාවරණය කර තිබුණද, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, වෙළඳ බලපත්‍ර ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | හෙළිදරව් කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුගත විය යුතු වේ. | කර්මාන්ත බදු. ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ආදායම් සඳහා සමීක්ෂණ වාර්තා අනුව වාර්ෂික ඇස්තමේන්තු සකස් කර තිබුණද ඇස්තමේන්තු සියයට 100 ත් නිවැරදිව සකස් කල නොහැක. තවද මෙම බදු වර්ග 03 ම නියමිත වර්ෂයට අදාළව ලබාගෙන අදාළ බලපත්‍ර ආදිය නිකුත් කරන බැවින් උපචිත පදනම මත පිහිටා ඉදිරියට ගෙවීම් හෝ හිඟ ලැබීම් ලෙස මෙම ආදායම් වර්ග කිරීම තාත්වික නොවේ. |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2014, 2015, 2016 වර්ෂවලට අදාලව පුත්තලම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් ලැබිය යුතු මුද්දර ආදායම් රු.2,458,610 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | පසුගිය වර්ෂයට අදාලව අයකර තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබූ | පසුගිය වර්ෂවල ආදායම් සමුච්චිත | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී අදාළ මුදල් සමුච්චිත අරමුදලට |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් කට්ටි කිරීමේ සියයට 01 ක බදු රු.417,868 ක් හා මෝටර් ග්‍රේඩරය කුලියට දීමෙන් ලද ආදායම වූ රු.74,000 ක් ඇතුළුව රු.491,868 ක් සමුච්චිත අමුදලට බැර කර නොතිබුණි. | අරමුදලට ගැලපිය යුතු වේ. | බැර කිරීමට පියවර ගනිමි. |
| (iii) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.420,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | සියළුම ගෙවිය යුතු මුදල් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී අදාළ හිඟ මුදල ගැළපීමට පියවර ගනිමි. |
| (iv) | ආසියානු සංවර්ධන බැංකුවේ 05 වන ව්‍යාපෘතිය යටතේ ජල කුළුණක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරන ලද සවිසිරි උයන ඉඩමේ වටිනාකම රු.718,240 ක් ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | ආයතන වෙත පවරන ඉඩම් සහා වත්කම්වලින් ඉවත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී අදාළ ඉඩමේ වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගනිමි. |
| (v) | විජයකටුපොත ඉදිකරන ලද රු.2,602,241 ක් වටිනා ජල ව්‍යාපෘතිය ගිණුම්ගත කර නොතිබුණි. | සභා වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වේ. | විජයකටුපොත ජල ව්‍යාපෘතියේ අත රැඳවුම් මුදල් මේ වන තෙක් නිදහස් කර නොමැත. මෙම ව්‍යාපෘතිය ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ඉදිකර කර ඇති බැවින් එම මණ්ඩලයේ නිර්දේශයෙන් පසු මෙම ව්‍යාපෘතිය අප සභාව වෙත පැවරීම සිදු කරනු ලබන අතර 2018 සැප්තැම්බර් 06 දින මෙම වත්කමේ හිමිකම පවරා දෙන ලෙස ඉල්ලීම් කලද මේ වන තෙක් මෙම වත්කම අප සභාව වෙත පවරා දී නොමැති බැවින් ගිණුම්ගත කළ නොහැක. |
| (vi) | සභාව විසින් පරිභෝජනය කරන හා කුලී පදනම මත ලබාදෙන රු.110,800 ක් වටිනා 10x10 ප්‍රමාණයේ රෙදි ආවරණ 08 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකර කර්මාන්ත අතැති තොග ලෙස දක්වා තිබුණි. | සභාව සතු දැනට පරිහරණය කරන වත්කම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී අදාළ රෙදි ආවරණ ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනිමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | අංක126 (XxVII) උපවගන්තිය | ධීවර කාර්මිකයින් සඳහා සුභසාධන පහසුකම් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම මගින් සුභසාධනයන් පුළුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල අතුරු ව්‍යවස්ථාව ඉදිරියේදී පනවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 1988 ප්‍රා දේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) රීති අංක 5(7) | මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි. | මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු වේ. | මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධව අභ්‍යන්තර විගණන සැලැස්ම තුළින් වර්ෂයකට එක් වතාවක්ද ගබඩා ලැබීම් සටහන් මගින්ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින්ද අභ්‍යන්තර විගණනයක් සිදු කරනු ලැබේ. |
| | (ii)රීති අංක 33 | වරිපනම් ගෙවීම පැහැර හරින පුද්ගලයින් පිළිබඳ ලයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තුවක් පිළියෙල කොට දේපළ තහනම් කිරීමේ නිලධාරියා වෙත භාරදී නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා ලේඛනයක් පවත්වාගෙන යාමට පෙන්වා දුන් පරිදි කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (iii)රීති අංක 165 | වරිපනම් බදු, අක්කර බදු, ජල බදු, කඩ කුලී, බදු කුලී, උසාවි දඩ, මුද්දර ගාස්තු, ආදායම් / ආධාර, වරෙන්තු ගාස්තු, දඩ හා ආදායම් ගිණුම් පවත්වා නොතිබුණි. | එක් එක් ආදායම් සම්බන්ධ ගිණුම් පවත්වාගත යුතුයි. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී මෙම ගිණුම් නිසියාකාරව පිළියෙල කිරීමට පියවර ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv)රීති අංක 218 | සභාවේ සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ මණ්ඩල පත්කිරීමට කටයුතු කළ යුතුය. | උපදෙස් පරිදි කටයුතු කරමි. |
| (ඇ) | වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ප්‍රලේ/අ/අ/05/06 දරන 2012 පෙබරවාරි 26 දිනැති ලිපිය | අප්‍රසන්න ව්‍යාපාර 67 ක්, අන්තරාදායක ව්‍යාපාර 26 ක් සහ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර 39 ක් සඳහා පාරිසරික බලපත්‍ර ලබාදී නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධව නීතිමය පියවර ගත යුතුයි. | මේ වන විට දක්වා ඇති කර්මාන්තකරුවන් සඳහා පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස දන්වා ලිපි යවා ඇති අතර ඉදිරියේදී එම කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u> | | | |
| | (i) XXIV පරිච්ඡේදයේ 1.6 ඡේදය | ස්ථාන මාරුවී ගොස් සිටින නිලධාරීන්/ සේවකයින් 39 දෙනෙකුගේ රු.129,760 ක් වූ ණය මුදල් වසර 11 ක කාලයක් තුල නිරවුල් වී නොතිබුණි. | හිඟ සේවක ණය ශේෂ සඳහා ඇපකරුවන්ගේ තොරතුරු සොයාබලා හිඟ ණය ශේෂය අයකර ගත යුතුවේ. | 2008 වර්ෂයට පෙර සිට තිබෙන සේවක ණය සම්බන්ධව කිසිදු තොරතුරක් අප සතුව නොපවතින අතර ලේඛනාගාරයේ පෞද්ගලික ලිපි ගොනු තිබෙන පුද්ගලයන් හට ලිපි යවා ඇති නමුත් ඒ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත. ඒ අතරින් ඇතැම් පුද්ගලයින් මිය ගොස් ඇති බවද, ඇතැමුන් පදිංචිය වෙනස් කොට ඇති බවද, ඇතැමුන් විදේශ ගතව ඇති බවද වාර්තා වූ නමුත් ඒ පිළිබඳ නිශ්චිත තොරතුරක් ලැබී නොමැති නිසා එම ණය ශේෂයන් අය කර ගත නොහැකිව ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,090,303 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,054,473 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018වර්ෂය | | | | 2017වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | අයවැය ගත | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 7,059 | 7,085 | 6,834 | 10,945 | 3,562 | 6,365 | 4,293 | 10,744 |
| කුලී | 4,856 | 7,609 | 9,838 | 2,492 | 5,133 | 8,327 | 8,587 | 4,738 |
| බලපත්‍ර ගාස්තු | 1,135 | 1,185 | 1,209 | - | 1,170 | 1,554 | 1,554 | - |
| වෙනත් ආදායම් | 49,048 | 49,048 | 26,329 | 54,226 | 48,367 | 47,515 | 53,100 | 35,640 |
| ❖ රැස් | 62,098 | 64,927 | 44,210 | 67,663 | 58,232 | 63,761 | 67,534 | 51,122 |

කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි වරිපනම් හා බදු ආදායමින් රු.6,834,000 ක් රැස්කර තිබූ අතර, එය රැස්කළ යුතු ආදායමෙන් සියයට 38 ක් විය. කුලී ආදායමින් රු.9,838,000 ක් රැස්කර තිබූ අතර එය රැස්කළ යුතු ආදායමින් සියයට 80 ක් විය. රැස්කළ යුතු වෙනත් ආදායම්වලින් | නීති ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

රු.26,329,000 ක් රැස්කර තිබූ අතර, එය රැස්කළ යුතු මුදලින් සියයට 31 ක් විය.

### 2.2.3 වරිපනම් හා බදු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.9,865,197 ක් වූ අතර එම හිඟය තුල සමාලෝචිත වර්ෂයට අදාලව රැස්කළ මුදල රු.2,479,649 ක් විය. ඒ අනුව රැස්කළ මුදල සියයට 41 ක් විය. තවද පසුගිය හිඟ වරිපනම් බදු වටිනාකමින් සමාලෝචිත වර්ෂය තුලදී අයකළ මුදල රු.3,314,180 ක් විය. | ආදායම් නිසි පරිදි අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා සෑම සතියකටම දින දෙකක් හිඟ ආදායම් රැස්කිරීමේ කටයුතු සඳහා වෙන් කර ඇති අතර දේපළ තහනම් කිරීමේ කටයුතු මඟින් හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කෙරේ. |

### 2.2.4 ව්‍යාපාර බදු

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත හා බිල්කළ ආදායම රු.600,000 ක් වූ අතර අය කිරීම් රු.1,028,280 ක් විය. ඒ අනුව ඌන ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික විය යුතු වේ. | 2018 වර්ෂයට අදාළව ඌන බිල් කිරීමක් සිදුවුවද 2019 වර්ෂයේදී එය නිවැරදිව සිදු කිරීමට කටයුතු කරමි. |

### 2.2.5 ව්‍යාපාර බලපත්‍ර

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.500,000ක් වූ අතර එහි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද ආයතනයකින් ලැබිය යුතු සියයට 01 ක බදු රු.200,000 ක්ද විය. ඉතිරි රු.300,000 ක් ඇස්තමේන්තුගත මුදල ලෙස බිල් කර තිබුණද අයකර ඇති මුදල රු.283,574 ක් විය. සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාව 415 ක් වූ | අනුමැතිය සඳහා යැවූ අයදුම් පත්‍ර වලින් නිකුත් නොකළ ඒවා සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදුකළ යුතු වේ. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත අනුමැතිය සඳහා යැවූ අයදුම්පත් සමහරක් නොලැබීම හා නිර්දේශ නොකරන ලද අයදුම්පත් ද ඒ අතර නිසා ආදායම අඩු විය. |

අතර බලපත්‍ර නිකුත් කළ ආයතන සංඛ්‍යාව 290 ක් විය. මේ අනුව ගිණුම්ගත නොවූ හිඟ වෙළඳ බලපත්‍ර ආදායම රු.125,000 කට ආසන්න විය.

**2.2.6 බදු කුලී**

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල බිල් කළ බදුකුලී මුදල රු.6,612,368 ක් වූ අතර රැස්කළ ආදායම් රු.8,431,085 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී මුදල රු.2,168,681 ක් විය. | හිඟ බදු කුලී වෙනුවෙන් නීතිමය පියවර ගත යුතු වේ. | දේපල අයිතිය බදුදීම යන ආදායම් ශීර්ෂය යටතේ ඇති පසුගිය වර්ෂවලට අදාල ටෙන්ඩර් බදු මුදල් හිඟයක් ලෙස පෙන්වා ඇත. |

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.7,367,599 ක් වූ උසාවි දඩ සහ රු.36,066,067 ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පෙන්වා ඇති පරිදි අයකර ගතයුතු ආදායමෙන් අඩකට වඩා මේ වනවිටත් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් ද කඩිනමින් අයකර ගැනීමට පියවර ගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පනත මගින් ප්‍රකාශිත අතුරු ව්‍යවස්ථා 17ක් පනවා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ix හි උ,ඌ,එ,ඒ අනුව මහජන සෞඛ්‍ය සහ සුබ විහරණ ක්‍රම පිළිබඳව කටයුතු කිරීම, පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව මේ සම්බන්ධව කටයුතු කෙරේ. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සාමාජීය වටිනාකමින් යුත් කුරුළු අභය භූමිය රැක ගැනීම සඳහා 126 වගන්තිය යටතේ xi (ඉ) යටතේ අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අදාල අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර තිබූ අතර එහි ප්‍රගතිය පරීක්ෂා කර ඇගයීමට ලක්කර දුර්වලතා හඳුනාගෙන වැඩිදියුණු කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රගතිය පරීක්ෂා කර දුර්වලතා හඳුනාගෙන වැඩසටහන් වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාර්ෂික සංවර්ධන සැලැස්මට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර එම වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ඊට අදාල ගොනුවේද, මූල්‍ය ප්‍රගතිය මාසික මූල්‍ය ප්‍රගති වාර්තාවට අනුවද සකස් කර තිබුණි. ඒ අනුව මින් ඉදිරියට එකම වාර්තාවකට ප්‍රගතිය සකස් කිරීමට පියවර ගනු ලැබේ. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| ප්‍රාදේශීය බල සභා ප්‍රදේශය තුල ට්‍රැක්ටර් රථ 03 ක් යොදා ගනිමින් දිනකට කසළ ටොන් 01 ක් පමණ එකතු කර ප්‍රදේශයේ ඉඩමක වලක් පිරවීම සඳහා එම කසළ යොදා වරින් වර පස් වලින් වැසීම සිදුකරමින් තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) සමාලෝචිත වර්ෂයේදී කොම්පෝස්ට් ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද කසළ බැහැර කිරීම සඳහා සුදුසු පරිසරයකින් යුත් ඉඩමක් සභාව සතුව නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළ බැහැරලීම සඳහා සුදුසු ඉඩමක් නොමැති වීම හේතුකොටගෙන විවිධ අපහසුතාවයන්ට මුහුණ දෙමින් සිටි. මානවේරියවත්ත රාජකදළුව ඉඩමේ කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා වූ දරන ලද වැයම ප්‍රදේශවාසීන්ගේ |

| | | | |
|---|---|---|---|
| | | | විරුද්ධතාවය මත අඩාල විය. |
| (ii) | සභාව විසින් රැස් කරන කසළ වර්ගීකරණයකින් තොරව බැහැර කිරීම නිසා නොදිරන ද්‍රව්‍ය මත සිදුවන පරිසර බලපෑම සැළකිල්ලට ගෙන නොතිබුණි. | කසළ වර්ගීකරණය කර අදාල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ යුතු වේ. | 2018 වර්ෂයේදී ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කරනු ලැබුවත් එම අපද්‍රව්‍ය බේල් කිරීමක් අවශ්‍ය විය. නමුත් අප සභාව වෙත බේල් යන්ත්‍රයක් නොමැති හෙයින් එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආයතන වෙත ලබාදීමටද නොහැකි විය. නමුත් 2019 වසරේ හලාවත නගර සභාවේ බේල් යන්ත්‍රයෙන් බේල් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදුකර ඒවා ප්‍රතිචක්‍රීකරණ ආයතන වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව ව්‍යාපාරික ස්ථාන 1136 ක් ඇතත් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාරික බලපත්‍ර ආදායම් රැස්කර තිබුණේ ව්‍යාපාර 295 කින් පමණි. එය සියයට 26 ක ප්‍රතිශතයක් විය. | ව්‍යාපාරික ස්ථාන වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම සිදු කළ යුතු වේ. | වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව ව්‍යාපාරික ස්ථාන 1136 ඇතුලත බලපත්‍ර ලබා ගත යුතු ස්ථාන පමණක් නොව කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා බලපත්‍ර ලබා ගත යුතු ස්ථාන සියල්ල ඇතුළත් වේ. |
| (ආ) | වාර්ෂිකව වැඩිවෙමින් පවතින බදු, මුද්දර ගාස්තු හා දීර්ඝ කාලයක සිට අයවීමකින් තොරව පවතින වරිපනම් බදු, අක්කර බදු, කඩ කාමර කුලී, උසාවි දඩ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අදාල නීතිමය පියවර ගත යුතු වේ. | පවතින හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර හා වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |
| (ඇ) | සියළුම බදු දේපළ සඳහා ගිවිසුම් ගත විය යුතු වුවත් ආනවිලන්දුව ප්‍රදේශයේ බදු දෙන ලද කඩ කාමර 04 ක් වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | විධිමත් බදු ගිවිසුම්වලට ඇතුලත් විය යුතු වේ. | මේ වන විට පෙන්වා දී ඇති කඩකාමර සඳහා ගිවිසුම් ගතවීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 87 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 75 ක් වූ අතර එහි ද්විතීක ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 06 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 06 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත ප්‍රමාණය අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | දැනට පවතින තනතුරු 02 ක පුරප්පාඩු බඳවා ගැනීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව පවරාගෙන ගිණුම්ගත කර තිබූ රු.7,675,400 ක් වටිනා ඉඩම් කොටස් 03 ක්, රු.1,584,816ක් වටිනා සතිපොළ මස් වෙළඳසැල හා රු.13,322,294 ක් වටිනා ඉදිකිරීම් 04 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුයි. | ඉඩම් කොටස් 03 හා සතිපොළ මස් වෙළඳසැල ඉදිරි වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට පියවර ගනිමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබූ අයවැය අනුව වැය විෂයයන් 54 ක රු.3,381,252 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයයන් 49 ක ප්‍රතිපාදනයෙන් සියයට 20 ට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි. එසේම ප්‍රාග්ධන ලැබීම් සඳහා අයවැය සකස් කර නොතිබුණි. | ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කල යුතු වේ. | විජයකටුපත ජල ව්‍යාපෘතියේ ජල නල එළීම් ණයහිමි වශයෙන් දක්වා ඇති අතර ප්‍රතිපාදන නොලැබුණි. ක්‍රීඩා භූමි, සුසාන භූමි සංවර්ධන කටයුතු සඳහා අදාළ ඉඩම් පවරා නොදීම නිසා අදාළ සංවර්ධන කටයුතු සිදු නොකළ අතර නල ළිං අළුත්වැඩියාවට අවශ්‍යතා ඉදිරිපත් නොවීම හා විවිධ ආයතන අනුග්‍රහ ලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කල යුතු වේ. | මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකය හඳුන්වා දී ඇති අතර එමගින් විගණන පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. |